ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ
***

# පුවත්පත් නිවේදනය

## 10 වන ජාත්‍යන්තර යෝගා දිනය කොළඹදී උත්කර්ෂවත් ලෙස සැමරේ

10 වන ජාත්‍යන්තර යෝගා දිනය නිමිත්තෙන් ඉන්දියානු සංස්කෘතික මධ්‍යස්ථානය සහ එහි සංස්කෘතික අංශය වන ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය විසින් සංවිධානය කළ සැමරුමක් 2024 ජූනි 22 වන දින කොළඹ ගාලු මුවදොර පිටියේදී පැවැත්විණ. 10 වන ජාත්‍යන්තර යෝගා දිනයේ තේමාව වන 'පුද්ගලයා සහ සමාජය සඳහා යෝගා' යන්න අර්ථවත් කරමින් යෝගා ලෝලීන් සිය ගණනක් මේ සඳහා සහභාගී වූහ.

2. ඉන්දීය මහ කොමසාරිස් ශ්‍රී සන්තෝෂ් ජා මහතා විශේෂ අමුත්තන් වූ අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත, අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය ආචාර්ය විජයදාස රාජපක්ෂ, විදේශ අමාත්‍ය අලි සබ්‍රි, නාවික හමුදා මාණ්ඩලික ප්‍රධානි රියර් අද්මිරාල් ප්‍රදීප් රත්නායක සහ ශ්‍රී ලංකා මහ බැංකු අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ යන මහත්වරුන් සහ අනෙකුත් සම්භාවනීය අමුත්තන් සමඟ යෝගා සැමරුම සඳහා සහභාගී විය.

3. ගාලු මුවදොර පිටියේ මෙම සැමරුම බෞද්ධාගමික කටයුතු සමඟින් ඇරඹි අතර පැමිණ සිටි සියලු දෙනා වෙත බුද්ධ රත්නයේ ආශිර්වාදය ලබා දෙමින් එම වතාවත් සිදු කරන ලද්දේ රත්මලාන පරම ධම්ම චේතිය පිරිවෙනේ පරිවේණාධිපති අති පූජ්‍ය මාඉටිපේ විමලසාර නාහිමියන් විසිනි. ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ ප්‍රමුඛ පෙළේ යෝගා මධ්‍යස්ථාන 25ක ප්‍රවීණයන් විසින් යෝගා සහ භාවනා පිළිබඳ සැසියක් පවත්වන ලදී.

මයුරපති ශ්‍රී භද්‍රකාලි කෝවිලේ සිසු දරු දැරියන් විසින් අපූර්ව යෝගා ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී.

4. ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය විසින් දින 10ක් රට පුරා සංවිධානය කළ යෝගා මහෝත්සවය ගාලු මුවදොර පිටියේ පැවති යෝගා සැමරුමෙන් සමාප්තියට පත් විය. මෙයට අමතරව හම්බන්තොට සහ යාපනය ඉන්දියානු කොන්සියුලර් ජෙනරාල් කාර්යාල සහ මහනුවර සහකාර මහ කොමසාරිස් කාර්යාලය විසින් ද විවිධ යෝගා වැඩසටහන් සංවිධානය කරන ලදී. සමස්තයක් ලෙස මෙවන් වැඩසටහන් 100ක් ශ්‍රී ලංකාවේ වැදගත් ස්ථානයන් හි සංවිධානය කර තිබිණ. කොළඹ ජාතික කෞතුකාගාරය, ජය ශ්‍රී මහා බෝධිය, සීගිරිය, රාවණා ඇල්ල, සීතා අම්මාන් කෝවිල, ඩෙල්ෆ්ට් දූපත, ග්‍රෙගරි ලේක්, ගාලු කොටුව, යාපනය කොටුව සහ දෙවුන්දර ප්‍රදීපාගාරය යන ස්ථානවල ද යෝගා වැඩසටහන් සංවිධානය කර තිබිණ. මේ සඳහා ශ්‍රී ලංකාවේ සංචාරක අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය, ආරක්ෂක අමාත්‍යාංශය, වරාය, නාවික සහ ගුවන් සේවා අමාත්‍යාංශය සහයෝගය ලබා දෙන ලදී.

5. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් 2014 වසරේදී ඉන්දියාව විසින් සිදු කළ යෝජනාවක් අනුව සෑම වසරකම ජූනි 21 වන දින 'ජාත්‍යන්තර යෝගා දිනය' ලෙස නම් කරන ලදී. මෙම යෝජනාව සඳහා රටවල් 170කට අධික සංඛ්‍යාවක් සහයෝගය ලබා දුන් අතර ශ්‍රී ලංකාව සම අනුග්‍රාහකත්වය ලබා දුන් රටක් විය.

***

කොළඹ
2024 ජූනි 23